ආරම්භය 1945-09-30 ලි.ප. අංකය:39/82
දෙහිවල,සුදර්ශන පාරේ,ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනයේ පිහිටි
දෙහිවල බෞද්ධෝදය සංගමය මගින්, ධර්මදානය පිණිස සෑම පුර පසළොස්වක පොහොය දිනයක් පාසා නිකුත් කරන මාසික දහම් කලාපය.

# බෞද්ධෝදය

82 වර්ෂය - ශ්‍රී බු: ව 2570 2026 ඔක්තෝබර් 25 වප් කළාපය

**ඓතිහාසික සිතුල්පව්ව රාජමහා විහාරය,**
**ඓතිහාසික යටගල රාජමහා විහාරය ප්‍රමුඛ අෂ්ඨ මහා විහාරාධිපති,**
**දක්ෂිණ ලංකාවේ සමථ බල සම්පන්න ප්‍රධාන අධිකරණ සංඝනායක**
**සද්ධර්ම කීර්ති ශ්‍රී රතනසාර,**
**කොළඹ නාලන්ද විද්‍යාලයේ හිටපු ධර්මාචාර්ය,**
**ශාස්ත්‍රපති, පූජ්‍ය, ලේල්වල සමීක ස්වාමීන්වහන්සේ**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

# "සැපය"

**සුඛා මත්තෙය්‍යතා ලෝකේ - අථෝ පෙත්තෙය්‍යතා**
**සුඛා සුඛා සාමඤ්ඤතා ලෝකේ - අථෝ බ්‍රහ්මඤ්ඤතා සුඛා**

**(ධම්ම පදය, නාග වග්ග)**

මෙම ගාථාවට නිදාන කථාව ලෙස ධම්මපද අට්ඨවාවේ දක්වා ඇත්තේ සංයුත්ත නිකායේ මාර සංයුත්තයේ රජ්ජ සූත්‍රයේ දැක්වෙන සිදුවීමයි. එහිදී බුදුරජාණන්වහන්සේ මාර දිව්‍ය පුත්‍රයාට සැපය පිළිබඳ ප්‍රභේද 12 ක් ඇතුළත් වන ගාථා තුනක් දේශනා කළ බව ධම්මපද අට්ඨවාවේ දැක්වේ. එම සැප 12 සඳහන් වන ගාථා තුන වන්නේ නාග වග්ගයේ 12,13,14 යන ගාථා තුනයි. එහෙත් රජ්ජ සූත්‍රයේ එම ගාථා තුන නැත. ඒ වෙලාවේ මේ ගාථා තුන දේශනා කළා යැයි කියන්නේ ධම්ම පද අට්ඨවාවේ පමණි.

එක් කලෙක බුදුරජාණන් වහන්සේ හිමාලය පර්වතය අසල ආරණ්‍ය කුටියක වැඩ වසද්දී උන්වහන්සේට මෙබඳු සිතිවිල්ලක් ඇති වුණා.
"අනුන් නොමරමින්, අනුන් ලවා නොමරවමින්, අනුන්ගේ ධනය පැහැර නොගනිමින්, අනුන් ලවා පැහැර නොගන්වමින්, අනුන් ශෝකයට

පත් නොකරමින්, අනුන් ලවා ශෝක නොකරවමින් දැහැමින් රාජ්‍යය පාලනය කරන්න බැරිද?

මේ සිතුවිල්ල දැනගත් වසවර්ති මාරයා බුදුහාමුදුරුවන් වෙත ඇවිත් මෙහෙම කියනවා. "ඔබවහන්සේ ඔය කියන විදියට රාජ්‍ය පාලනය කරන්න." මාරයා හිතුවේ බුදුහාමුදුරුවො නැවතත් පරණ පුරුදු විදියට රජකම් කරන්න යාවි කියලා. ඊළඟට බුදුහාමුදුරුවො මාරයාගෙන් ඇහුවා "මාරය, ඔබ එහෙම කියන්නේ ඇයි?" කියල .

"භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේ සතර සෘද්ධිපාදයන් (ඡන්ද,චිත්ත, විරිය, වීමංස) තමාගේ සිත තුළ දියුණු කරල, වඩල තියෙනවා (=භාවිතා), වරක් දෙවරක් නෙවෙයි නැවත නැවත බොහෝ වාරයක් පුරුදු කරල තියෙනවා. (=බහුලීකතා) දක්ෂ රියැදුරෙක් තමන්ගේ රථය ඕනෑම තැනක පහසුවෙන් හසුරුවනවා වගේ මේ සතර සෘද්ධිපාදයන් ඕනෑම තැනක පහසුවෙන් හසුරුවන්න පුළුවන් බවට පත් කරගෙන තියෙනවා. (=යානීකතා) තමන්ගේ ජීවිතයේ ලබාගත්ත ආධ්‍යාත්මික ශක්තිවල පදනම බවට පත්කරගෙන තියෙනවා. (වත්ථු කතා) මේවා තමන්ගේ සිත තුළ ස්ථාවරව නොසැලෙන විදියට තැන්පත් කරගෙන තියෙනවා. (අනුට්ඨිතා) ඕනෑම විදියකට පරිහරණය කරන්න පුළුවන් හුරුපුරුදු දෙයක් බවට පත්කරගෙන තියෙනවා. (පරිචිතා) ආරම්භයේ සිට අවසානය දක්වා ඉතා දක්ෂ ලෙස වීර්යයෙන් යුක්තව සම්පූර්ණ කරගෙන තියෙනවා.(=සුසමාරද්ධා)"

සතර සෘද්ධිපාද කියන්නේ බුදුවරුන්ට, රහතුන්ට ඇති විශේෂ ශක්තියක්. ඕනෑම උතුම් අරමුණක්, සෘද්ධි බලයක් ළඟා කර ගැනීමට තියෙන මූලික පදනම සතර සෘද්ධිපාදයි. 'ඉද්ධි' යන වචනයේ තේරුම ' අරමුණ ඉටුවීම හෙවත් "සමෘද්ධ වීම" යි 'පාද' කියන්නේ ඒ සඳහා උපකාර කර ගත හැකි 'ක්‍රමය'යි මේ හතරම එකිනෙකට සම්බන්ධයි.

• ඡන්ද සෘද්ධිපාදය :
උතුම් අරමුණක් ඉටුකරගන්න හිතේ කැමැත්තක් ඇති වුණාම ඒ කැමැත්තට කියනවා 'ඡන්ද ඉද්ධිපාද' කියල. රහත් බව ලබාගන්න අවශ්‍ය ප්‍රතිපදාව පුරන්න ඕන කියල පළමුවෙන්ම හිතේ කැමැත්තක් ඇති කරගන්න ඕන. ලෞකික ජීවිතයේ යහපත් අරමුණුඉටු කර ගන්නත් මේ කැමැත්ත මුලින්ම ඇති වෙන්න ඕන. තමන් තුළ කැමැත්තක් නැත්නම් බලහත්කාරයෙන් ඔහු එතැනට යවන්න බැහැ. කැමැත්තෙන් කළොත් තමයි ඒ අදහස සාර්ථක වෙන්නේ.
• චිත්ත ඉද්ධිපාදය :
තමා කිරීමට බලාපොරොත්තු වන කටයුත්ත හෙවත් ඉලක්කය කෙරෙහි හිත වෙනස් කර නොගෙන ඒක ගැනම හිත යොමු කර ගෙන ඉන්න ඕන. අනවශ්‍ය වැඩ වලට හිත ගියොත් තමන්ගේ අරමුණු ඉටු කරගන්න බැහැ. ශිෂ්‍යයා විභාගය සමත් වීම ගැනත්, ව්‍යාපාරිකයා තම ව්‍යාපාරය සාර්ථක කර ගැනීම ගැනත්, දේශපාලකයා රට දියුණු කිරීම ගැනත්, භික්ෂුව තමාගේ විමුක්තිය සහ බුදුසසුනේ දියුණුව ගැනත්, රැකියාව කරන්නා තම රැකියාව ගැනත් හිත යොමු කරගෙන හිටියොත් ඒ වැඩේ සාර්ථක වෙනවා.

• විරිය ඉද්ධිපාදය :
කැමැත්ත තිබුණත්, ඉලක්කය ගැන හොඳින් හිතේ තියාගෙන හිටියත් එය ඉටු කර ගන්න උත්සාහ ගත්තේ නැතිනම් බලාපොරොත්තුව බිඳ වැටෙනවා. ඒ සඳහා කොපමණ දුක් විඳින්න සිදු වුණත්, කොපමණ බාධක ආවත් අරමුණ ඉටුවන තුරුම උත්සාහය අත් හරින්න හොඳ නැහැ. ඒ සඳහා කැප වෙන්න ඕන. දැන් මහන්සියි කියල පහුබහින්න එපා. කල් දමන්න එපා. අසාර්ථක වීම් ඇති වුණත් ඊට හේතු හොයල ඒවා නැති කර ගෙන ඉදිරියටම යන්න ඕන. මේ සඳහා අනුගමනය කළ යුතු කරුණු හතරක් "සතර ප්‍රධන් වීර්ය" යනුවෙන් දක්වා තියෙනවා.

I. අරමුණු ඉටු කර ගැනීමට බාධා වන අදහස් (අකුසල්) මතු වන්නට නොදී ඒවා ඇති වන විටම යටපත් කිරීමට උත්සාහ කිරීම.
II. සිතේ දැනටමත් තියෙන එබඳු අදහස් (අකුසල්) හඳුනා ගෙන එම දුර්වලතා නැති කිරීමට උත්සහ කිරීම.
III. තමාගේ සිතේ මේ වන විට එම අරමුණ ගැන ඇති නොවූ අදහස් (කුසල්) මොනවාදැයි සොයා බලා ඒවා ඇති කර ගැනීමට උත්සාහ කිරීම.
IV. දැනටමත් තමාගේ සිතේ තියෙන හැකියාවන්, දක්ෂතාවන් (කුසල්) මොනවා දැයි පරික්ෂා කොට ඒවා තවදුරටත් වර්ධනය කර ගැනීමට උත්සාහ කිරීම.

• වීමංසා ඉද්ධිපාදය :
'වීමංසා කියන්නේ 'නුවණ'යි අරමුණ ඉටු කර ගැනීමට නම් තමා කරන කටයුත්ත ගැන නුවණ මෙහෙයවා ගැටළු, අඩුපාඩු හඳුනාගෙන පිළියම් කළ යුතුයි. ප්‍රගතිය, ගුණ-දොස් පියවරෙන් පියවර සොයා බලා අවශ්‍ය තැනදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. වැරදි ක්‍රමවේද තිබේ නම් ඒවා දුරු කළ යුතුයි.

"මේ විදියට සතර සෘද්ධිපාද වඩපු ඔබවහන්සේට මේ හිමාලය පර්වතය රත්‍රන් බවට පත් කරල එයින් රට දියුණු කරන්න පුළුවන්. මාත් උදව් කරන්නම්" කියල මාරයා බුදුහාමුදුරුවන්ට යෝජනා කළා. "මාරය, මේ වගේ රත්‍රන් පර්වත දෙකක් තිබුණත් එයින් එක පුද්ගලයකුගේ සිත තෘප්තිමත් කරන්න බැහැ. ඤාණවන්තයා ඒ බව දැනගෙන පස්කම් සැප දුරුකරන්න කටයුතු කරනවා." යැයි බුදුහාමුදුරුවෝ පිළිතුරු දුන්න. නියම සැපය කුමක්ද කියා ගාථා තුනකින් කරුණු පැහැදිලි කළා. ගාථා තුනේ තියෙන්නේ එම සැප 12 යි.

1. තමන්ට තනිව කරගත නොහැකි කටයුතු වලදී හොඳ මිතුරන් සිටීම සැපයක්.
2. තමන්ට ලැබෙන තරමින් සතුටු වීම සැපයක්.
3. පින් කර ගත්තා නම් මැරෙන වෙලාවේ ඒක සැපයක්.
4. සියලු සංසාරික දුක් නැති කිරීම සැපයක්.
5. තමාට හැකි පමණින් මවට සැලකීම සැපයක්.
6. තමාට හැකි පමණින් පියාට සැලකීම සැපයක්.
7. පැවිද්දන්ට සැලකීම, ගරු බුහුමන් දැක්වීම සැපයක්.
8. රහතුන්ට සැලකීම, ගරු බුහුමන් දැක්වීම සැපයක්.
9. සිල්වත්ව හිටියා නම් වයසට යන විට ඒක සැපයක්.

10. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඇති කර ගැනීම සැපයක්.
11. මාර්ග ප්‍රඥාව පහළ වීම සැපයක්.
12. පව් නොකිරීම සැපයක්.

මේ දේශනාව අහල මාරයා කලබල වුණා.

බුදුහාමුදුරුවො තමන්ගේ අදහස දැනගත් බව තේරුම් ගත් මාරයා වහාම අතුරුදහන් වුණා මාරයා හිතුවේ බුදුහාමුදුරුවන් ආපසු ලෞකික ජීවිතයකට යොමු කර ගන්න පුළුවන් වේයි කියලා.

දියුණුවට යමක් කරන කොට, ඒක වළක්වන්න සමහරු උත්සාහ කරනවා. දියුණු වෙල ඉන්න අය පිරිහෙළන්න තවත් අය උත්සාහ කරනව. මේ මාර බලවේග හඳුනාගෙන බුද්ධිමත්ව කටයුතු කළොත් ඔබට ඔබේ යහපත් අරමුණු ඉෂ්ට කර ගන්න පුළුවන්. ඒ නිස හැමවිටම නුවණින් යුක්තව වැඩ කරන්න.

**ඔබ සැමට තෙරුවන් සරණයි!**